කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය
2017/2018 අධ්‍යයන වර්ෂය
ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පළමු වසර
දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2020 පෙබරවාරි)

ආර්ථික විද්‍යාව

**ECON 22414/SOST 22434 : සාර්ව ආර්ථික විද්‍යාව - I**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. i. 'සමාහාර ඉල්ලුම පහළ යාම නිසා ඇතිවන ආදායම් ප්‍රතිවිපාකය සහ එහි මිල ප්‍රතිවිපාකය සමාහාර සැපයුම් වක්‍රයේ හැඩය මත තීරණය වේ.'' සුදුසු ප්‍රස්ථාර භාවිතා කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

ii. කේන්සියානු සමාහර සැපයුම් වක්‍රය සම්භාව්‍යවාදී සමාහාර සැපයුම් වක්‍රයෙන් වෙනස් වන්නේ කෙසේද ? මෙම සැපයුම් වක්‍ර දෙකෙන් වඩා ප්‍රායෝගික වන්නේ කුමක්දැයි අදහස් දක්වන්න.

(ලකුණු 10)

02. i. කේන්සියානු පාරිභෝජන න්‍යායේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කොට එහි අදාළත්වය පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 10)

ii. අදාල රූප සටහන් හා සමීකරණ යොදා ගනිමින් සරළ ආර්කථියක, රාජ්‍ය ආර්කථියක හා විවෘත ආර්කථියක සමතුලිත ජාතික ආදායම් මට්ටම තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

03. i. විවෘත ආර්ථිකයක් උපකල්පනය කොට, එහි MPC = 0.8, t = 0.2 MPM = 0.04 වශයෙන්ද පවතින බව සිතන්න. එම ආර්ථිකය තුළ, ස්වායත්ත පරිභෝජන වියදම (Ca) \$ 660, ස්වායත්ත බදු (T) \$ 200, සාවායත්ත ආයෝජන (I) \$ 500 සහ රාජ්‍ය වියදම් (G) \$ 500 ක් සහ ශුද්ධ අපනයන (NX) \$ 300 වශයෙන් ඇති අවස්ථාවක,

අ. සමතුලිත ජාතික ආදායම ගනනය කරන්න.

(ලකුණු 10)

ආ. ගුණකයෙහි අගය සොයන්න.

(ලකුණු 10)

ඇ. සමතුලිත පාරිභෝජන වියදම සොයන්න.

(ලකුණු 02)

ඈ. එහි කාන්දුවීම් විදීම්වලට සමාන වන බව පෙන්වන්න.

(ලකුණු 05)

ඉ. රාජ්‍ය වියදම $ 150 කින් අඩු වූ විට සමතුලිත ජාතික ආදායම වෙනස් වන ආකාරය පෙන්වන්න.

(ලකුණු 04)

ඊ. නව සමතුලිත ආදායම සහ පරිභෝජන වියදම ගණනය කරන්න.

(ලකුණු 02)

04. මුදල් ප්‍රමාණයේ වැඩිවීමක් මිල මටට්මමේ වැඩිවීමකට තුඩු දෙන ආකාරය සම්භාව්‍ය මුදල් ප්‍රමාණවාදී පිෂර් ගේ අනුවාදය (Fisher's Theory) මගින් පැහැදිලි කොට, මිල මටට්ම තීරණය වීම පිළිබඳ න්‍යායක් වශයෙන් එහි පවතින දුර්වලතාවයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

05. මිල මටට්ම තීරණය වීම පිළිබඳ න්‍යායන් වශයෙන් සහ මුදලට ඇති ඉල්ලුම පිළිබඳ න්‍යායන් වශයෙන් මුදල් ප්‍රමාණවාදී කේම්බ්‍රිජ් අනුවාදය පැහැදිලි කොට අදහස් දක්වන්න. (Cambridge Theory)

(ලකුණු 25)

06. මුදලට ඇති ඉල්ලුම පිළිබඳ කේන්සියානු න්‍යායට අනුව මුදලට ඇති ඉල්ලුම කෙරෙහි බලපාන සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

07. පොළී අනුපාතය තීරණය වීම පිළිබඳ න්‍යායන් කෙටියෙන් පැහැදිලි කොට ඒවායෙහි අදාලත්වය විමසන්න.

(ලකුණු 25)